M 922

University of Colombo Sri Lanka
22 OCT 2015
Examination Branch
Colombo - 03

# ප්‍රාථමික අධ්‍යාපනයේ දෙවන ප්‍රධාන අවධියේ සිසුන්ගෙන් අපේක්ෂිත නිපුණතා සාධනය සහ ඒ කෙරෙහි බලපාන සාධක පිළිබඳ අධ්‍යයනයක්

අධ්‍යාපන දර්ශනපති උපාධි(පූර්ණකාලීන)

**2010 – 2012**

ශාන්ත කුමාර විදානගමගේ
**2010/M.Phil/S/11**
අධ්‍යාපන පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය

UCLIB
588048

**2014.01.24**

සංක්ෂිප්ත සටහන

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ප්‍රාථමික අධ්‍යාපන කාලය අවධි ත්‍රිත්තවයකට බෙදා ඇත. මෙම අවදි ත්‍රිත්වය යටතේ ඒ ඒ අවධියට සුවිශේෂ වූ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා මට්ටම් කරා සිසුන් පැමිණිය යුතු අතර අදාළ නිපුණතා මට්ටම් තුළ ප්‍රවීණත්වයන් ඇති කිරීම ගුරුභවතුන් විසින් අනිවාර්යෙන්ම සිදුකළ යුතුව ඇත. ඊට අමතරව අභිමත නිපුණතා මට්ටම් දක්වා සිසුන් කැදවාගෙන පැමිණීමට ද ගුරුභවතුන් විසින් සිදු කළ යුතුව ඇත. මේ සඳහා සහයෝගය දෙනුවස් විෂයමාලා සංවර්ධන නිලධාරීන් හා අනෙකුත් වග කිවයුතු අධ්‍යාපන නිලධාරීන් මෙන්ම ගුරු උපදේශක නිලධාරීන් ද යෝග්‍ය පරිදි අදාළ ක්‍රියාමාර්ග ගත යුතුව ඇත. ඉහත පදනමේ හා යොමුවීම් ඇසුරින්, සහශ්‍ර සංවර්ධන ඉලක්ක ප්‍රමුඛ කොටගත් ජාතික මෙන්ම විවිධ ජාත්‍යන්තර ප්‍රඥප්තිමය තීරණ හා බැදීම්වලට ද අනුකූලවෙමින් ප්‍රාථමික අධ්‍යාපනයේ විශිෂ්ඨතා වෙත යොමුවීමට ශ්‍රී ලංකාව බැදී සිටී.

සම අධ්‍යාපන අවස්ථා සම්පාදනය කිරීමේ නොනිමි කර්තව්‍ය යටතේ, ග්‍රාමීය ප්‍රදේශවල අධ්‍යාපනය, වැඩිහිටි අධ්‍යාපනය හා කාන්තා අධ්‍යාපනය විවිධත්වයෙන් තොරව ලබාදීම, අධ්‍යාපනිකාංශ වර්ධනය හා සම්පත් ලබාදීමේ ක්‍රියාවලින් තුළින් එකී තත්ත්වය ජනනයට ද අපේක්ෂිතය. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පනත අනුව සම අධ්‍යාපන අවස්ථා සෑම දෙනාටම නීත්‍යානුකූලව ලබාදීම සිදුවිය යුතුය. විශ්වීය මට්ටමෙන් මෙන්ම ජාතික මට්ටමෙන් ද ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය තුළ ඉහත පරමාදර්ශීය තත්ත්වය ජය ගැනීම ව්‍යාකූලත්වයක පැවතීම මත, එකී තත්ත්වයෙන් මිදීම උදෙසා අතීතයේ සිට විවිධ පියවර ගෙන ඇතත් එහි සපලත්වය පිළිබඳ විෂමතා විද්‍යමාන වේ.

නිපුණතා පාදක අධ්‍යාපන ප්‍රවේශය යටතේ එක් එක් අවධියට අදාළව අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා අනිවාර්යෙන්ම සිසුන් විසින් සපුරාගත යුතු වන අතර ගුරුවරුන් ඒ සඳහා කටයුතු කළ යුතුවේ. තත්ත්වය එසේ නම්, දෙවන ප්‍රධාන අවධියේ හෝ තෙවන ප්‍රධාන අවධියේ සිසුවකුට "තම නම නිවැරදිව ලියා ගැනීමට නොහැකිවීම" සිදුවිය හැකිද? අවාසනාවකට මෙන් එවැනි බොහෝ අවස්ථා වාර්තාව ඇත. ප්‍රාථමික අධ්‍යාපනය තුළ ජාතික මට්ටමින් පවත්වන විභාගවල බින්දු(0) ලබාගන්නා සිසුන් ද වාර්තාව ඇත. මෙකී ආනුභවික ව්‍යාකූලතාවය, අපහැදිලි බව තුළ ප්‍රාථමික අධ්‍යාපනයේ විශිෂ්ඨතා කරා යොමුවීම උදෙසා සිදුකර ඇති ප්‍රඥප්තිමය බැදීම්වලට හානියක් සිදුවෙමින් පවතී. එසේම අනාගත ප්‍රාථමික අධ්‍යාපනයේ සාධනීය තත්ත්වය උදෙසා, ගුණාත්මක සංවර්ධනයක් උදෙසා බලපෑම් සිදුවෙමින් පවතී. ඒ අනුව ප්‍රාථමික අධ්‍යාපනයේ යහදායී සඵල ක්‍රියාකාරීත්වයක් සඳහා පර්යේෂණාශ්‍රිතව විසදුම් සෙවීම අත්‍යවශ්‍යයන්ම සිදුකළ යුතු කාලීන යුතුකමක්ව ඇත.

ඒ අනුව, මෙම පර්යේෂණය පහත සඳහන් අරමුණු මත පිහිටා ක්‍රියාත්මක කරන ලදි.

1. ග්‍රාමීය හා නාගරික පාසල්වල සිසු නිපුණතා මට්ටම පිළිබඳ විමසා බැලීම
2. සිසු නිපුණතා සාධනය කෙරෙහි බලපා ඇති පවුල හා පාසල ආශ්‍රිත සමාජ ආර්ථික සාධක විමසා බැලීම.

3. ග්‍රාමීය හා නාගරික ප්‍රාථමික පාසල් පසුබිම තුළ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ක්‍රියාත්මකවීමේදි ඒ පිළිබඳ ගුරුවරයා සතු දැනුම හා ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයේ ස්වරූපය විමසා බැලීම.
4. නිපුණතා සාධනය කරගැනීමේදී සිසුන්ට හා නිපුණතා සාධනය කරවීමේදී ගුරුභවතුන්ට මතුවන දුෂ්කරතා හඳුනා ගැනීම.

ප්‍රාථමික අවධියේදී ලබාදෙන අධ්‍යාපනය සමස්ථ ජීවිතයේ පදනම, අනාගත පැවැත්ම පිළිබඳ තීරණාත්මක සංසිද්ධිය වන බැවින් එහි පවතින නොපැහැදිලි තැන් පැහැදිලි කරගනිමින් වහ වහා ගැටලු සඳහා විසඳුම් ලබාගත යුතුව ඇත. ඒ අනුව සිසුන් තුළ පවතින නිපුණතා සාධනය කරගැනීමේ මට්ටම කෙබඳුද? එම සාධන මට්ටම් අතර පවතින විශේෂ ලක්ෂණ මොනවාද? නිපුණතා සාධන මට්ටම අතර විෂමතා පවතීද? සාධන විෂමතා ඇති වීමේදී බලපාන සාධක මොනවාද? අදාළ සාධක මත කවර මට්ටමකින් නිපුණතා සාධනය කෙරෙහි බලපෑම් ඇති කෙරේද? අදාල සාධක හා නිපුණතා අත්කර ගැනීම අතර පවතින සම්බන්ධය කෙබඳුද? නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමයේ භාවිත නිවැරදිද? නිවැරදි භාවිත සඳහා ගුරුභවතුන් දැනුවත්ද? ගුරුභවතුන් දැනුවත් කිරීම සඳහා පවත්නා මඟ පෙන්වීම විවිධ මට්ටමින් උචිත පරිදි සිදු වේද? යන්න සොයා බැලීම වැදගත් වේ. එසේම විෂයමාලා සැකසීම, ගුරු මාර්ගෝපදේශ සැකසීම, ඒවා නිසි පරිදි හඳුන්වාදීම, නිසි පරිදි ලබාදීම සිදුවන්නේද? යන්නත් නිපුණතා සාක්ෂාත් කරගැනීමේදී සුවිශේෂීව සිසුන්ට බලපාන සාධක මෙන් ම ගුරුභවතුන්ට බලපානු ලබන සාධක මොනවාද? යන්න ද හඳුනා ගැනීම අතිශයින් වැදගත් වේ.

නිපුණතා පාදක අධ්‍යාපන ප්‍රවේශය යටතේ කටයුතු කරන ප්‍රාථමික අංශ ගුරුවරයා තුළ ප්‍රාථමික අධ්‍යාපනික අපේක්ෂා හා පදනම පිළිබඳ වැටහීමකින් කටයුතු කිරීම වැදගත් වේ. විශේෂයෙන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා පිළිබඳ ගුරුභවතුන්ට පවතින අවබෝධය කෙබඳු මට්ටමක පවතීද? එය ප්‍රමාණවත්ද? එහි අවශ්‍යතාව හඳුනාගෙන ගුරුභවතුන් ක්‍රියාකරයිද? එහි අවශ්‍යතාව හඳුනාගත් ප්‍රමාණය කොපමණද? යන්නත් මෙම එක් එක් අංශ යටතේ ග්‍රාමීය හා නාගරික මට්ටමේ වෙනසක් විද්‍යමාන වේද යන්නත් අධ්‍යයනයට ලක්කෙරිණි. එසේම අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා මට්ටම් තක්සේරු කිරීම නිවැරදි ව සිදුවේද? ඒ සඳහා භාවිත ක්‍රමවේදයන් ප්‍රාථමික අධ්‍යාපන අපේක්ෂණවලට කෙතෙක් උචිත ද යන්නත්, තක්සේරු මැනවින් වාර්තා කරන්නේද? වාර්තා කරන්නේ නම් එකී වාර්තා සිසුන්ගේ සහ ගුරුභවතුන්ගේ ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය සඳහා භාවිත කිරීමේ යෝග්‍ය බව පිළිබඳවත් අධ්‍යයනයට ලක්කෙරිණි. එසේම අභිමත ඉගෙනුම් නිපුණතා පිළිබඳ ගුරුභවතුන්ට පවතින අවබෝධය කෙබඳු මට්ටමක පවතීද? එහි අවශ්‍යතාව හඳුනාගෙන ගුරුභවතුන් ක්‍රියාකරයිද? යන්නත් ඉහත දක්වා ඇති සිව්විධ අධ්‍යනයේ අරමුණු මත පිහිටා අධ්‍යයනයට ලක් කරන ලදි.

මෙම පර්යේෂණ ක්‍රියාවලියේ වාර්තාව ප්‍රධාන පරිච්ඡේද 5ක් යටතේ ඉදිරිපත් කරයි. එහිදී ප්‍රධාන මාතෘකා 15ක්, අනු මාතෘකා 126ක්, යටතේ අධ්‍යයන පර්යේෂණ වාර්තාව සකසා ඇති අතර වගු 67ක්, පින්තූර 14ක් උපයුක්ත කරගනිමින් හා උප ග්‍රන්ථ 34 ක ශාස්ත්‍රීය දායකත්වය යටතේ සමස්ථ පර්යේෂණ වාර්තාව සකසා ඇත.

පර්යේෂණය තුළින් එළඹි නිගමන හා පර්යේෂණ අවසානයේදී ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය ඵලධායී හා සමස්ථ සාධාරණත්වය කාර්යක්ෂමව ඇති කරනු වස් යෝජනා ඉදිරිපත් කර ඇත. "සාධන සමතාවන් ඇති කර, සහශ්‍ර සංවර්ධන ඉලක්ක ජයගත හැකි හා ඉන් ඔබ්බටද යොමුවීම සඳහාවූ ගුණාත්මක අධ්‍යාපනය යෝජනා" නම් වූ පුළුල් අරමුණුගත යෝජනා ඉටුකරනු වස් නව්‍යත්වයෙන් යුතු "දසවිධ" යෝජනාවලියක් ඉදිරිපත් කොට ඇත. පුළුල් දර්ශනයක් සහිත ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, ගුරුභවතුන්ගේ ගැටලු විසඳා, හැකියා සංවර්ධනයකර ඵලධායී හා කාර්යක්ෂම සිසු නිපුණතා සංවර්ධනයක් සඳහා යොමුකිරීම, ප්‍රායෝගිත්වය අර්ථවත්වන විෂයමාලා සම්පාදන අවශ්‍යතා ඉටු කිරීම, ගුරුභවතුන්ගේ පුහුණු අවශ්‍යතා කඩිනම් කිරීම,ඵලධායී කිරීම හා විෂමතා දුරලීම, ගුරුභවතුන් සම්බන්ධව කටයුතු කරන්නන්ගේ කාර්යක්ෂම බව, ඵලධායීත්වය හා විවිධ අවශ්‍යතා තුළින් සාර්ථකත්වයට යොමුවීම

සිසු අවශ්‍යතා තහවුරු කර, බාධා මැඩලමින් හැකියා සංවර්ධනය කිරීම, විදුහල්පති ඇතුලු, අභ්‍යන්තර පරිපාලන රටාවේ විධිමත් හා සැලසුම්කාරී බව තුළින් සාර්ථකත්වයේ මහ පාදා ගැනීම දෙමාපියන් දැනුවත් කිරීම තුළින් සාර්ථක ප්‍රාථමික අධ්‍යාපනයක් තහවුරු කිරීම ,දේශපාලන අධිකාරියේ කැපවීම යතාර්ථයක් බවට පත්කිරීම, නිලධාරීන්ගේ වගකීම ආනුභවික යථාර්ථයක් බවට හැරවීම සහ වගවීමෙන් කටයුතු කිරීමේ හැකියා ඇති කිරීම යටතේ ප්‍රාථමික අදාපනයේ "නව ප්‍රබල ආරම්භයක් උදෙසා" නව්‍ය හා පවත්නා එහෙත් කාර්යක්ෂම භාවයට පත් කළ යුතු යෝජනා ඉදිරිපත් කර ඇත.